සැ. යු. - 2021.09.03 දින පළ වූ අංක 2244 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,245 - 2021 සැප්තැම්බර් මස 10 වැනි සිකුරාදා - 2021.09.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1880 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1888 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 ඔක්තෝබර් මස 01 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 සැප්තැම්බර් මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය අඅඅග ාදජමපැබවීගටදඩගකන වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1877 - B 822657 — 5,403 (2021/09)
B-1

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කළක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිළධාරි පුරප්පාඩු

1. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පහත සඳහන් ශාඛාව වෙත ස්වේච්ඡා නිළධාරින් ලෙස අධිකාරියට පත්කොට බඳවා ගැනීමට සුදුසු පිරිමි / කාන්තා අපේක්ෂකයින් සඳහා පුරප්පාඩු පවතී.

   *අ.* විද්‍යුත් ඉංජිනේරු ශාඛාව (පිරිමි / කාන්තා)

2. පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ඇති පිරිමි / කාන්තා අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**මූලික අධ්‍යාපන සුදුසුකම් :**

*අ.* අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එක් වරක දී ඕනෑම අංශයකින් අවම වශයෙන් විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි.

*ආ.* ජාත්‍යන්තර පාසල් වල ඉගෙන ගත් (Pearson / Edexcel - International Ordinary / Advance Level, GCSE, GCE, Cambridge exam qualification) සිසුන් සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ඉහත දෙවන ඡේදයේ සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් සමඟ සැසඳෙන බවට සනාථ කරන ලද අයදුම්කරුවන් පිළිබඳව සලකා බලනු ලැබේ.

**වෘත්තීය / ශාස්ත්‍රීය සුදුසුකම්**

*අ.* විද්‍යුත් ඉංජිනේරු ශාඛාව

(1) **පර්යේෂණ නිලධාරි - පිරිමි/ කාන්තා (ස්වේච්ඡා)**

**විංග් කමාණ්ඩර්**

මහාචාර්ය/ ආචාර්ය මට්ටමේ සුදුසුකම් ලත් වෘත්තීකයින් විය යුතු අතර ගුවන් විදුලි/සන්නිවේදන, ඉංජිනේරු භෞතික විද්‍යාව හා රොබෝ තාක්ෂණය සහ යාන්ත්‍ර ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව හදාරා විදුලි, ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශන ඉංජිනේරු යන ක්ෂේත්‍රයන්හි අවම වශයෙන් අවුරුදු 5ක පළපුරුද්දක් තිබීම.

හෝ

**ස්කොඩ්‍රන් ලීඩර්**

ශාස්ත්‍රපති උපාධිධාරී මට්ටමේ සුදුසුකම් ලත් වෘත්තීකයින් විය යුතු අතර විදුලි, ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශන ඉංජිනේරු, රසායනික හෝ ජෛව විද්‍යා ඉංජිනේරු, දුරස්ත සංවේදනය, යාන්ත්‍රික හා යාන්ත්‍ර ඉලෙක්ට්‍රොනික විද්‍යා ඉංජිනේරු, සයිබර් ආරක්ෂණ හෝ ජාලකරණ ඉංජිනේරු විද්‍යාව, නැනෝ තාක්ෂණය සහ උපකාරක පිළිබඳව අවම වශයෙන් අවුරුදු 5ක පළපුරුද්දක් තිබීම.

3. **මූලික සුදුසුකම් :**

| | | |
|---|---|---|
| *අ.* පුරවැසිභාවය | : | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය |
| *ආ.* සිවිල් තත්ත්වය | : | විවාහක / අවිවාහක |
| *ඇ.* ස්ත්‍රී පුරුෂ භාවය | : | පිරිමි / කාන්තා (අදාළ පරිදි) |
| *ඈ.* වයස | : | 2021 නොවැම්බර් මස 01 වන දිනට<br>ස්කොඩ්‍රන් ලීඩර් - අවුරුදු 40ට නොවැඩි විය යුතුය<br>විංග් කමාණ්ඩර් - අවුරුදු 50ට නොවැඩි විය යුතුය |

ඉ. උස : පිරිමි - සෙන්ටිමීටර් 165 (අඩි 5 යි අඟල් 5) ක් හෝ ඊට වැඩි විය යුතුය
කාන්තා - සෙන්ටිමීටර් 162.5 (අඩි 5 යි අඟල් 4) ක් හෝ ඊට වැඩි විය යුතුය

ඊ. බර : පිරිමි 17 < ශරීර ස්කන්ධ දර්ශකය > 26
කාන්තා 17 < ශරීර ස්කන්ධ දර්ශකය > 25

$$\text{ශරීර ස්කන්ධ දර්ශකය} = \frac{\text{බර (කි.ග්‍රෑ.)}}{\text{උස (මී)}^2}$$

උ. පපුව : අඟල් 32 ට නොඅඩු විය යුතුයි (පිරිමි)

ඌ. වර්ණ දෘෂ්ටිය : සීපී2

4. **විශේෂ සටහන් :**

අ. ඉහත සඳහන් 2 සහ 3 ඡේදයේ දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂා කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* ඉල්ලා ඇති මිනුම්වලට අනුව උස, ඇස් පෙනීම හා බර නොමැති අපේක්ෂකයින් විශේෂ කුසලතාවක් නොමැති නම් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ.

ආ. තෝරාගනු ලබන අපේක්ෂකයින්ව ඔවුන්ගේ සුදුසුකම් හා පලපුරුද්ද අනුව ගුවන් හමුදාධිපතිගේ අභිමතය පරිදි ගුවන් හමුදාවේ ස්කොඩ්‍රන් ලීඩර් / විංග් කමාණ්ඩර් යන නිලයන්හි අධිකාරියට පත් කරනු ලැබේ.

ඇ. තෝරා ගනු ලබන සියලුම අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රමිතියට අනුව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

ඈ. සියලුම මූලික, ශාස්ත්‍රපති හා ආචාර්ය උපාධීන් සහ ඩිප්ලෝමාවන් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් බවට සනාථ කළ යුතුය.

ඉ. යම් අයදුම්කරුවෙකු ඉහත දක්වා ඇති අවශ්‍යතාවයන් නියමිත පරිදි සපුරා නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් / දක්ෂතාවයක් ඇත්නම් ගුවන් හමුදාධිපතිතුමාගේ අභිමතය පරිදි ඔහු / ඇය බඳවාගැනීම පිළිබඳව සලකා බලනු ලැබේ.

ඊ. තාක්ෂණය ආශ්‍රිත පර්යේෂණ ක්ෂේත්‍රයේ වර්තමාන විශිෂ්ට දක්ෂතා ලබා තිබීම පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

උ. රාජ්‍ය භාෂා අවශ්‍යතා :- තෝරාගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පවත්නා, පනවා ඇති සහ මතු පනවනු ලබන්නාවූ ද ව්‍යවස්ථා පිළිපැදිය යුතුය.

ඌ. තෝරා ගනු ලබන අපේක්ෂකයින් ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලබන ස්ථානයක දී කෙටි අනුගතවීමේ පුහුණුවක් ලැබිය යුතුය. පුහුණුවන අවස්ථාවේ දී විෂමාචාරය නිසා හෝ තමාට පාලනය කරගත හැකිව තිබූ වෙනත් කරුණු නිසා හෝ නිලධාරියෙකු නුසුදුසු බවට වගකිව යුත්තන් විසින් වාර්තා කරනු ලැබුවහොත් එම නිලධාරියාට පිරිනමනු ලැබූ අධිකාරිය ආපසු ගැනීම සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විනය රෙගුලාසිවලට අනුකූලව වෙනයම් විනයානුකූල ක්‍රියාමාර්ගයන්ට යටත් වීමට හෝ බැඳී සිටින්නේය.

එ. වෛද්‍ය පරීක්ෂණය සමත්වන සියලුම අයදුම්කරුවන් අවසන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ශාඛාව සඳහා වන අයදුම්කරුවන් සංඛ්‍යාව සහ අවසන් සම්මුඛ පරීක්ෂණය සඳහා සූදානම් ලේඛනයට (standby list) අයදුම්කරුවන් තෝරා ගැනීම කුසලතා ලැයිස්තුව අනුව සිදුකරන අතර සියලුම සම්මුඛ පරීක්ෂණ සහ සෙසු පරීක්ෂණ අවසානයේ අවසාන කුසලතා ලැයිස්තුව පිළියෙල කරනු ලැබේ. තමන්ට පවතින යම් නිධන්ගත රෝගයක්, ආබාධයක් පිළිබඳ ඉතිහාසය සඟවන හෝ යම් රෝගයකට නියම කරන ලද ඖෂධ පිළිබඳ හෙළි නොකරන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියෙන් ඕනෑම අවස්ථාවක ඉවත් කරනු ලැබේ.

ඒ. 1951 අප්‍රේල් මස 27 වන දින අංක 10,240 දරන *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කළ සංශෝධනය කරන ලද, ශ්‍රී ලංකා ගුවන් හමුදා ස්වේච්ඡා හමුදාවේ රෙගුලාසි අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරියෙකුගේ සේවා කොන්දේසි වේ. ගුවන් හමුදා පනතේ 10 වන වගන්තිය අනුව සෑම නිලධාරියෙකුම සේනාධිනායකයාගේ මනාපය පරිදි තම පත්වීමේ සිටිය හැක. කෙසේ වෙතත් තම අධිකාරියෙන් අස්වීමට නිලධාරියෙකුට බලයක් නැති අතර, ගුවන් හමුදා පනතේ 11 වන වගන්තිය අනුව සේනාධිනායක විසින් අස්වීමට ඉඩදිය හැක. ඇප / ගිවිසුම් බැඳී ඇත්නම් පුහුණු කාලය සහ පාඨමාලාවන් හදාරන්නේ නම් ඉහත සඳහන් පරිදි ගුවන් හමුදා පනතේ 11 වන වගන්තිය අනුව අස්වීමට නොහැක. ගුවන් හමුදාවේ විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂිත රෙගුලාසිවලට අනුව ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගැනීමට හැකි වේ.

ඔ. සූදානම් ලේඛනයේ (standby list) සිටින අයදුම්කරුවන්හට අවස්ථාව සලසාදීම සඳහා, අවසන් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්වන අයදුම්කරුවන් විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අනුයුක්ත වීම සඳහා වන අවසාන තීරණය අවසන් සම්මුඛ පරීක්ෂණයේදී හෝ එය අවසන් වූ වහාම ප්‍රකාශයට පත් කළ යුතුය. අවසන් සම්මුඛ පරීක්ෂණය සමත්ව, ශ්‍රී ලංකා ගුවන් හමුදාවට එක්වීමට නොහැකි බව නොදන්වා අවසාන බඳවා ගැනීමට නොපැමිණෙන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කිසිදු ඉදිරි අයදුම්කිරීමක් සඳහා සලකනු නොලැබේ.

ඕ. දුර්වල හැකියාවන් සහිත සහ නිවැරදි ආකල්ප, හැදියාවන්, චර්යාරටා නොදරන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියෙන් ඕනෑම අවස්ථාවක ඉවත් කරනු ලැබේ.

ක. තෝරාගත් නිලධාරීන් ගුවන් හමුදාධිපති විසින් අවශ්‍ය සහ නියම කර ඇති පරිදි පර්යේෂණ නිලධාරී රාජකාරි සඳහා යොදවනු ලැබේ.

ග. ගුවන් හමුදා පනත සහ විටින් විට පනවනු ලබන නියෝග අනුව නිලධාරින් පාලනය කරනු ලැබේ.

ච. අවිවාහක නිලධාරින්, නිලධාරි නිවස්නයේ වාසය කළ යුතුය. ගෘහ භාණ්ඩ, නවාතැන් පහසුකම් හා ආහාරපාන ඔහුට / ඇයට සපයනු ලැබේ. බැට්මන් සේවයද සපයනු ලැබේ. අවිවාහක නිලධාරින්ගේ ආහාර දීමනාව සහ බැට්මන් දීමනාව භෝජනාගාරයට ගෙවනු ලැබේ.

ජ. විවාහක නිලධාරින්ට විවාහක නිවාස ඇත්නම් සපයනු ලැබේ. මේ සඳහා රජයේ ආයතන සංග්‍රහයට අනුව කුලිය අයකරනු ලැබේ. විවාහක නිලධාරින් විවාහක නිවස්නයක වාසය කරනු නොලබන්නේ නම් 5. ආ. (11) ඡේදයේ පරිදි නිවාස කුලී දීමනාවන් හිමි වේ.

5. **වැටුප් හා දීමනා :**

අ. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරිලත් නිලධාරින්ගේ වැටුප් පහත සඳහන් පරිදි වේ.

| නිලය \ වසර | 2021 (වාර්ෂිකව) රුපියල් |
|---|---|
| පයිලට් ඔෆිසර් (ශිෂ්‍ය නිලධාරි) | 502,860.00 |
| ෆ්ලයින් ඔෆිසර් | 571,380.00 - (30x16020) = 1,051,980.00 |
| ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් | 667,500.00 - (24x16020) = 1,051,980.00 |
| ස්කොඩ්‍රන් ලීඩර් | 731,580.00 - (22x16020) = 1,084,020.00 |
| විංග් කමාන්ඩර් | 751,140.00 - (17x19560) = 1,083,660.00 |

ආ. අනෙකුත් දීමනා :

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 7,800.00 ක් ගෙවනු ලැබේ.

(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කළ පසු දිරි දීමනා වශයෙන් මසකට රු. 250.00 ක් ගෙවනු ලැබේ.

(3) දුෂ්කර දීමනා මසකට රු. 620.00 ක් ගෙවනු ලැබේ. (දිනකට රු. 20.00 බැගින්)

(4) ක්‍රියාන්විත සේවා ප්‍රදේශවල සේවය කරන්නන්හට අමතර දුෂ්කර දීමනා මසකට රු. 4,380.00 ක් ගෙවනු ලැබේ.

(5) විශේෂ දීමනාව මසකට රු. 3,100.00 ක් ගෙවනු ලැබේ. (දිනකට රු. 100.00ක් ගෙවනු ලැබේ)

(6) අතිරේක දීමනාව මසකට රු. 1,000.00 ගෙවනු ලැබේ.

(7) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව - එයාර් කොමඩෝර් සහ ඉහළ නිලයන් සඳහා රු. 600.00 ක් ද, ගෘෘප් කැප්ටන් සහ පහළ නිලයන් සඳහා රු. 525.00 ක් මසකට ගෙවනු ලැබේ.

(8) බැට්මන් දීමනාව මසකට රු. 637.50 ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)

(9) ආහාර දීමනාව මසකට රු. 24,005.47 ක් ගෙවනු ලැබේ. (දිනකට රු. 774.37 පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)

(10) සුදුසුකම් වේතනය අදාළ පරිදි (මසකට උපරිමය රු. 637.50 ක්) ගෙවනු ලැබේ.

(11) රජයේ නිවාසවල වාසය නොකරන විවාහක නිලධාරින් හට පහත සඳහන් පරිදි නිවාස කුලී දීමනාවක් හිමිවේ. පයිලට් ඔෆිසර් සිට ස්කොඩ්‍රන් ලීඩර් සහ ඊට ඉහළ නිලයන් සඳහා මසකට - රු. 3,200.00 සිට රු. 8,500.00 දක්වා.

(12) දුරකථන බිල් දීමනාව විංග් කමාන්ඩර් නිලයේ සිට එයාර් වයිස් මාර්ෂල් නිලය දක්වා මසකට රු. 2,500.00 සිට රු. 5,000.00 දක්වා ගාස්තුවක් ගෙවනු ලැබේ.

(13) නොමිලේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට /කලත්‍රයාට සහ දරුවන්ට) දෙනු ලැබේ.

(14) කඳවුර තුළ වාසය කරන නිලධාරින්ට මසකට වරක් නිලධාරි නිවස්නයේ සිට තම නිවසට යෑම සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

(15) නිල ඇඳුම් හා ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.

(16) නොමිලේ වෛද්‍ය පහසුකම්. (තම පවුලේ සාමාජිකයන්ට අදාල පරිදි)

(17) පිටත වාසය කිරීමට අවසර දී ඇති විවාහක නිලධාරින්ට සැතපුම් 30ක් තුළ රාජකාරි ස්ථානයට නොමිලේ ගමන් කිරීම සඳහා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බලපත්‍රයක් දෙනු ලැබේ.

(18) ඉංජිනේරු දීමනාව මසකට රු.15,000.00 ක් ගෙවනු ලැබේ. (ඉංජිනේරු ශාඛාවේ සුදුසුකම්ලත් නිලධාරින්හට පමණි)

6. විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා :- විටින් විට සංශෝධනය කරනු ලැබූ සහ 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප් පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලුම නිලධාරින් දායකයන් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුවය.

7. ඉල්ලුම්කරුවන්ට උපදෙස් :

*අ.* පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම්පතේ සියලුම කොටු හැකි පමණ විස්තර හා පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම්පත් 2021 සැප්තැම්බර් මස 24 වන දින මධ්‍යහ්න 1200 ට හෝ ඊට පෙර ලැබෙන සේ "විධායක ආධුනිකයින් බඳවා ගැනීමේ නිලධාරි, ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල, කොටුගොඩ, යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ ඉහළ ''පර්යේෂණ නිලධාරී සඳහා ඉල්ලුම්පත'' යනුවෙන් සඳහන් විය යුතුය. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් සලකා බලනු නොලැබේ.

*ආ.* රාජ්‍ය සේවයේ / සංස්ථා / මණ්ඩල / සිවිල් ආයතනයන්හි සේවයෙහි නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු / සංස්ථා / මණ්ඩල /සිවිල් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. යම් හෙයකින් අයදුම්කරු තෝරාගතහොත් තම කාර්යයෙන් නිදහස් කරන බවට සේවා යෝජකයා විසින් ලිපියක් මගින් දැනුම් දිය යුතුය.

*ඇ.* www.slaf.lk වෙබ් අඩවිය හරහා අයදුම්පත්‍ර භාගතකර ගැනීම් කළ හැක.

*ඈ.* සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් සමග සහතික කරනලද ඡායාපිටපත් ඉදිරිපත් කළ යුතුය.

(1) උප්පැන්න සහතිකය හා එහි ඡායා පිටපතක්. (අධ්‍යාපන ව්‍යාවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය වලංගු නොවේ).

(2) ජාතික හැඳුනුම්පත හා එහි ඡායා පිටපතක්.

(3) අයදුම්කර ඇති ශාඛාවට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව තහවුරු කිරීමට අධ්‍යාපන සහතිකපත්වල මුල්පිටපත් හා එහි ඡායාපිටපත බැගින්.

(4) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය / කාර්මික පුහුණුව හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතිකවල මුල්පිටපත හා ඡායාපිටපත බැගින්.

(5) මාස 06ක් ඇතුළත ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයඳුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය.

(6) ක්‍රීඩා සහතික හා විෂය පරිබාහිර ක්‍රියාකාරකම් පිළිබඳ සහතිකවල මුල්පිටපත් හා ඡායාපිටපත් බැගින්.

(7) මාස හයක් (6) ඇතුළත ලබාගන්නා ලද ග්‍රාම නිලධාරි සහතිකයක්.

(8) පාසල් හැරයාමේ සහතිකය.

(9) කාඩ්බෝඩ් ෆයිල් කවරයක් හා ෆයිල් ලේස් එකක්.

(10) අඟල් 2x2 ½ ප්‍රමාණයේ ග්‍රාම නිලධාරි විසින් සහතික කරන ලද වර්ණ ඡායා රූප දෙකක්.

*ඉ.* නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වය ගැන සලකා බලනු නොලැබේ.

*ඊ.* කිසිම වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමග නොඑවිය යුතුය.

*උ.* අයදුම්පත සමඟ සහතික වල මුල් පිටපත් එවා, ඒවා නැති වූවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

*ඌ.* අයදුම්පත්‍රවල සඳහන් අධ්‍යාපන සුදුසුකම් උස, වයස, පපු වට ප්‍රමාණය වැනි මූලික අවශ්‍යතාවයන්වල දත්ත මත පදනම්ව මූලික සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් කැඳවන අතර අයදුම්පත්‍රවල සාවද්‍ය තොරතුරු සපයා ඇති අයදුම්කරුවන් මූලික පරීක්ෂාවන්වලදී ඉවත් කරණන ලැබේ.

8. ඉල්ලුම්පතේ අසත්‍ය ප්‍රකාශයක් කර තිබේනම් එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අහිමිවීමටද, තෝරා ගනු ලැබීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු / ඇය සේවයෙන් පහකරනු ලැබීමටද යටත් වේ.

9. **තෝරාගැනීම, සම්මුඛ පරීක්ෂණ ආදිය :**

*අ.* ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයඳුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට ගුවන් හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට හා වෛද්‍ය පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේය. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම කරනු ලැබේ.

ආ. සම්මුඛ පරීක්‍ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්‍ෂකයින්ට සම්මුඛ පරීක්‍ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය ලිපියකින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

ඇ. මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු / ඇය විසින් ඉදිරිපත් කළ යුතුය.

ඈ. අපේක්‍ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවත්, එසේ කළ යුත්තේ ඔහුට / ඇයට සහතිකයක් දීමෙනි. අපේක්‍ෂකයකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ දැරීම එම අපේක්‍ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේය.

ඉ. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින් වෙත ඒ බව දන්වා එවනු නොලැබේ.

එස් කේ පතිරණ,<br>
ඩබ්ලිව්ඩබ්ලිව්වී (දෙවරක්), ආර්ඩබ්ලිව්පී (දෙවරක්),<br>
ආර්එස්පී (සිව්වරක්), වීඑස්වී, යූඑස්පී, එම්එස්සී (එම්ඕඑස්)<br>
යූඑස්ඒ, එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ,<br>
එම්ෆිල් (ඉන්දියා), එම්අයිඑම් (ශ්‍රී ලංකා),<br>
එන්ඩීසී (ඉන්දියා), පීඑස්සී, කිව්එෆ්අයි<br>
එයාර් මාර්ෂල්<br>
ගුවන් හමුදාධිපති

මූලස්ථානය,<br>
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,<br>
තැ.පෙ. 594<br>
කොළඹ 02

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

**ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාවේ විද්‍යුත් ඉංජිනේරු (පර්යේෂණ නිලධාරී) ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය : ..........................................................................................
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින්ද, ලියාපදිංචි වීමෙන්ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න)

2. සම්පූර්ණ නම : (ජාතික හැඳුනුම්පතට අනුව) : ..........................................................................................
.. ..........................................................................................

3. ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................................

4. ඉල්ලුම් කරන ශාඛාව : ..........................................................................................

5. ඉල්ලුම් කරන තනතුර ៖ ..........................................................................................

6. ස්ථිර ලිපිනය : ..........................................................................................

7. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය : ..........................................................................................

8. ස්ථිර ලිපිනයට ආසන්න ගුවන් හමුදා කඳවුර : ..........................................................................................

9. අධ්‍යාපනය ලැබූ පාසල : ..........................................................................................

10. තැපැල් ලිපිනය : ..........................................................................................

11. විද්‍යුත් ලිපිනය : ................................................................................................................................................

12. උපන් දිනය : ................................................................................................................................................

වයස : (2021 නොවැම්බර් මස 01 වන දිනට ) අවුරුදු : ............. මාස : ............. දින : .............

13. උස : සෙන්ටිමීටර් .................. .(අඩි......... අඟල් ...........)

14. පපුව : අඟල් ............................

15. බර : කිලෝග්‍රෑම් ......................................

16. දිස්ත්‍රික්කය : ................................................................................................................................................

17. ඡන්ද කොට්ඨාසය : ................................................................................................................................................

18. ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ අංකය : ................................................................................................................

19. දුරකථන අංක ................................................................................................................................................

20. විවාහක හෝ අවිවාහක බව : ................................................................................................................................

21. පාසල් සහ/ හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර :

| *පාසලේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව)* | |
|---|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ) | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | අ.පො.ස. (උ.පෙළ) | | | |
| | | | | |
| | | | | |
| | | | පොදු ඉංග්‍රීසි | |
| | | | සාමාන්‍ය පොදු පරීක්ෂණය | |
| | විශ්වවිද්‍යාල/වෙනත් සුදුසුකම් | | | |
| | වෘත්තිය තුළ ඇති වෙනත් සාමාජිකත්වයන් | | | |

22. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :

23. පාසලෙන් /විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර :

| සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

24. මව්පියන් පිළිබඳ විස්තර :

| සම්පූර්ණ නම | ජා.හැ.ප. අංකය | රැකියාව | | දැනට ලිපිනය |
|---|---|---|---|---|
| | | පෙර | දැනට | |
| පියා : | | | | |
| මව : | | | | |
| සහෝදර සහෝදරියන්ගේ : | | | | |
| | | | | |
| | | | | |

25. ලේ ඥාතීන් කවරෙකු හෝ දැනට හෝ කලින් ගුවන් හමුදා සේවයක් වේ නම් ඒ පිළිබඳව විස්තර :

| නිලය | නම | ශාඛාව/වෘත්තිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| | | | |

26. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ඨතා පිළිබඳ විස්තර : (ඔබ සහභාගී වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ඨතා දක්වන්න)

| අනු අංක | විස්තරය | පාසල් | පළාත් | ජාතික | අන්තර් ජාතික |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

27. පාසලේ දී, විශ්වවිද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවලදී දක්වා ඇති වෙනත් විශිෂ්ඨතා (දිනයන් සමග විස්තර දක්වන්න.) .. ........................................................................................................................................................................

28. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය : ........................................................................................................................................................................

29. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම්කර තිබේ ද? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. : ................................................ ........................................................................................................................................................................

30. සිවිල් හෝ යුධ අධිකරණයකදී වැරදිකරු වී හෝ ඇග බැඳ තිබේ ද? එසේ නම් විස්තර සඳහන් කරන්න. : ................................
..........................................................................................................................................................................................

31. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි / මණ්ඩලයක / සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්ව විද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරිමට හේතු : ..........................................................................................................................................................

32. චරිත සහතික පිළිබඳ විස්තර :

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

33. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

..................................................,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය : ........................................

09 - 97

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ඇක්වයිනස් උසස් අධ්‍යාපන ආයතනය**

වෘත්තීය හා තෘතියික කොමිෂන් සභාවේ ලියාපදිංචි (P01/0023)

NVQ 5 මට්ටමේ පාඨමාලා

2022 වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම

භෞතිකව දේශන පැවැත්වීමට අවස්ථාව ලැබෙන තුරු මාර්ගගත (Online) දේශන පවත්වනු ලැබේ.

පාඨමාලා ආරම්භය 2022 පෙබරවාරි

* වැවිලි කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - කාල සීමාව : මාස 26 යි. දේශන - සති අන්ත ඉරිදා

* කෘෂිකර්ම ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව - කාල සීමාව : මාස 26 යි. දේශන - සති අන්ත ඉරිදා

* සත්ත්ව පාලන ඩිප්ලෝමා පාඨමාලාව - කාල සීමාව : මාස 26 යි. දේශන - සති අන්ත ඉරිදා

* මල් වගාව හා උද්‍යාන අලංකරණය ඩිප්ලෝමා පාඨමාලාව - කාල සීමාව : මාස 26 යි. දේශන - සති අන්ත ඉරිදා

* ආහාර විද්‍යාව සහ තාක්ෂණය ඩිප්ලෝමා පාඨමාලාව - කාල සීමාව : මාස 26 යි. දේශන - සති අන්ත ඉරිදා

අ.පො.ස. (උසස් පෙළ) විෂයයන් 03ක් සමත් අයට හෝ අදාළ ක්ෂේත්‍රයේ NVQ 04 සහතික ඇති අයට හෝ උසස් පෙළ විෂයයන් දෙකක් සමත් අයට පාඨමාලාවලට අදාළ එක් එක් ක්ෂේත්‍රයන්හි වසර 03 ක වෘත්තීය පළපුරුදුතාවය අනුව ඉල්ලුම් කළ හැක. පාඨමාලා සඳහා ඇතුළත් වන සියලුම දෙනා අනිවාර්යයෙන්ම අ.පො.ස. (සා.පෙළ) සමතුන් විය යුතුය.

ඇතුළත් වීමේ තොරතුරු සඳහා පාඨමාලා සම්බන්ධීකාරක 0728173632

Tel : 2694014,/15, 4618689, 0117389115/22 Fax : 0112678463 Website : www.aquinas.lk

**ඇක්වයිනස් උසස් අධ්‍යාපන ආයතනය**

වෘත්තීය පාඨමාලා ඒකකය

මගින් පවත්වනු ලබන NVQ 4 මට්ටමේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර සහතික පත්‍ර පාඨමාලාවට 2022 වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම

අ.පො.ස. (සා.පෙළ) සමත් සහ අ.පො.ස. (උ.පෙළ) සමත් නොවූ අයට ඉල්ලුම් කළ හැක.

භෞතිකව දේශන පැවැත්වීමට අවස්ථාව ලැබෙන තුරු මාර්ගගත (Online) දේශන පවත්වනු ලැබේ.

පාඨමාලා ආරම්භය 2022 පෙබරවාරි

කාල සීමාව : මාස 12 යි. - දේශන - සති අන්ත ඉරිදා

මෙම සහතිකපත් පාඨමාලාව අවසානයේ NVQ 05 මට්ටමේ ඩිප්ලෝමා පාඨමාලා සඳහා ඇතුළත් වීමේ අවස්ථාව ඔබට ලැබෙනු ඇත.

ඇතුළත් වීමේ තොරතුරු සඳහා පාඨමාලා සම්බන්ධීකාරක 0728173632

Tel : 2694014,/15, 4618689, 0117389115/22 Fax : 0112678463 Website : www.aquinas.lk

09 - 100

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.